# වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
## வியாபாரமற்றும் கொள்கைத் திணைக்களம்
## Department of Trade and Investment Policy

මහලේකම් කාර්යාලය,කොළඹ - 01
செயலகம்,கொழும்பு - 01
The Secretariat, Colombo -01

මුදල් අමාත්‍යාංශය
நிதிஅமைச்சு
Ministry of Finance


| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.)<br>My No. | TIP/SS/01/03 | |
| ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | |
| දිනය<br>திகதி<br>Date | 2019.04.29 | |

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 22/99 යටතේ නිකුත් කර ඇති බලපත්‍ර ලාභීන්,
වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2018 සහ එහි සංශෝධන යටතේ නිකුත් කර ඇති බලපත්‍ර ලාභීන්
විදේශ කටයුතු අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 210 යටතේ නිකුත් කර ඇති බලපත්‍ර ලාභීන් වෙත

**සහනදායි පදනම මත මෝටර් රථ ලබා ගැනීම සඳහා වන බලපත්‍ර මත ණයවර ලිපි විවෘත කිරීම සඳහා අවස්ථාව සැලසීම.**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99, වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2018 (සංශෝධිත) සහ විදේශ කටයුතු අමාත්‍යාංශ චක්‍රලේඛ 210 යටතේ නිකුත් කරන ලද සහනදායී මෝටර් රථ බලපත්‍ර භාවිත කර ණයවර ලිපි විවෘත කිරීම සඳහා නැවත අවස්ථාව සැලසීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2019 අංක 05 දරන 2019.04.18 දිනැති චක්‍රලේඛය නිකුත් කර ඇත.

2. එම චක්‍රලේඛයේ විධිවිධාන පරිදි මෙතෙක් නිකුත් කර ඇති සහ ඉදිරියේදී නිකුත් කරනු ලබන බලපත්‍ර සඳහා බලපත්‍ර ලාභීන් විසින් පහත පරිදි ණයවර ලිපි විවෘත කිරීමට කටයුතු කල යුතු බව මෙයින් දැනුම් දෙමි.

**2.1. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 22/99 යටතේ නිකුත් කර ඇති බලපත්‍ර**

අ. 2018.12.31 දින හෝ එදිනට පෙර නිකුත් කරන ලද බලපත්‍ර සඳහා - 2019.05.01 දින හෝ එදිනෙන් පසුව
ආ. ඉහත දිනෙන් පසු නිකුත් කර ඇති සියළු බලපත්‍ර සඳහා - 2019.06.01 දින හෝ එදිනෙන් පසුව

**2.2. වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2018 සහ එහි සංශෝධන යටතේ නිකුත් කර ඇති බලපත්‍ර සඳහා සහ විදේශ කටයුතු අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 210 යටතේ නිකුත් කර ඇති බලපත්‍ර**

අ. 2018.09.30 දින හෝ එදිනට පෙර නිකුත් කල බලපත්‍ර සඳහා - 2019.06.01 දින හෝ එදිනෙන් පසුව
ආ. 2018.11.30 දින හෝ එදිනට පෙර නිකුත් කරන ලද බලපත්‍ර සඳහා - 2019.07.01 දින හෝ එදිනෙන් පසුව
ඇ. 2019.02.28 දින හෝ එදිනට පෙර නිකුත් කරන ලද බලපත්‍ර සඳහා - 2019.08.01 දින හෝ එදිනෙන් පසුව
ඈ. 2019.06.30 දින හෝ එදිනට පෙර නිකුත් කරන ලද බලපත්‍ර සඳහා - 2019.09.01 දින හෝ එදිනෙන් පසුව
ඉ. 2019.10.01 දින හෝ එදිනෙන් පසුව - ඕනෑම අවස්ථාවකදී නිකුත් කරන ලද බලපත්‍රයක් සඳහා ණයවර ලිපි විවෘත කල හැකි වේ.

3. දේශීයව එකලස් කරනු ලබන වාහන මිලදී ගැනීමට අපේක්ෂා කරනු ලබන බලපත්‍ර ලාභීන් ද සිය බලපත්‍ර මත වාහන ලබා ගැනීම සඳහා පළමු ගෙවීම සිදු කල යුත්තේ ඉහත දක්වා ඇති කාල වකවානු අනුවය.

4. ඉහත කාල වකවානු පිලිබඳව රේගු අධ්‍යක්ෂ ජනරාල් ඉතාමත් සුපරීක්ෂාකාරීව කටයුතු කරනු ලබන බැවින් ඉහත නියමයන් ගෙන් බැහැරව ණයවර ලිපි විවෘත කර ආනයනය කරනු ලබන වාහන / පළමු ගෙවීම සිදු කර මිලදී ගනු ලබන දේශීයව එකලස් කරනු ලැබූ වාහන, සාමාන්‍ය ආනයනයක් / දේශීය එකලස් කිරීමක් සේ සලකා අදාල සම්පූර්ණ බදු අය කිරීමටත් එවැනි බලපත්‍ර ලාභීන්ගේ බලපත්‍ර අවලංගු කිරීමටත් සිදු වනු ඇත.

5. තවද ඉහත නියමයන් අනුව අදාල කාලයේදී පමණක් සිය බලපත්‍ර සඳහා ණයවර ලිපි විවෘත කිරීමට /දේශීයව මිලදී ගැනීම සඳහා පළමු ගෙවීම සිදු කිරීමට සියළුම බලපත්‍ර ලාභීන් වග බලා ගත යුතු අතර එම නියමයන්ට අනුකූලව කටයුතු නොකරන නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ අදාල විධිවිධාන සහ වෙනත් පාලන විධිවිධානයන් අනුව විනයානුකූලව කටයුතු කිරීමට සිදුවන බවද දන්වා සිටිමි.

සී. ජයසූරිය
අධ්‍යක්ෂ ජනරාල්
වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති


දුරකථන අංකය / தொலைபேசி / Telephone: 0112 484 888
ෆැක්ස් / தொலைநகல் / Fax: 0112 484 830
විද්‍යුත් තැපැල / மின்-அஞ்சல் / e-mail: admin@ttipd.treasury.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk